වලපනේ ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
---------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ඔක්තෝබර් 21 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 ව්‍යාචන මතය
----------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකිවිය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම.
----------------------------------------------------------------------

ප්‍රදේශීය සභාව සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙලකර ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති.
-------------------------

ප්‍රාදේශීය සභාව සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන සමඟ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පදනම් කරගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු.
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 2012 නොවැම්බර් මස 21 දින සභාව වෙත භාරදී තිබූ ආදාහනාගාරයේ වටිනාකම වූ රු. 7,647,798ක් හා ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රියකරණ මධ්‍යස්ථානයේ වටිනාකම වූ රු.2,774,590ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොවීම නිසා ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම රු.10,422,388කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ). පුරනැඟුම ව්‍යාපෘතිය මඟින් 2013 සැප්තැම්බර් 11 දින සභාව වෙත ලබාදී තිබූ රු.3,450,574ක් වටිනා ටිපර් රථයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු ආයුර්වේද බෙහෙත් තොගයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු ස්ථාවර වත්කම් විෂයයන් 06ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

1.3.4 නොසැසඳූ පාලන ගිණුම්.

-----------------------------

ගිණුම් විෂයයන් 03කට අදාළ එකතුව රු.38,960,851ක් වූ පාලන ගිණුම් ශේෂයන්ගේ එකතුව අදාල උපයෝගී ලේඛණවල ශේෂයන්ගේ එකතුව වූ රු.37,297,918 ක මුදල සමඟ සැසඳීමේදී රු.1,662,933 ක වෙනසක් නිරීක්ෂණය වී තිබුණි.

1.3.5 අවිනිශ්චිත ගිණුම

-------------------

2013 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය රු.5,497ක් වූ අතර එම ශේෂයට පාදක වූ හේතු පරීක්ෂාකර බලා නිරවුල් කිරීමට විගණන දිනවූ 2014 අප්‍රේල් 11 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

1.3.6 ලැබිය යුතු ගිණුම්

--------------------

2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.17,216,167ක්වූ ලැබිය යුතු ගිණුම් ශේෂවල කාල විශ්ලේෂණය පිළියෙල කර නොතිබුණි.

1.3.7 ගෙවිය යුතු ගිණුම්

---------------------

2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ එකතුව රු.120,847,411ක් වූ ගිණුම් ශේෂවල කාල විශ්ලේශනය පිළියෙල කර නොතිබුණි.

1.3.8 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.22,447,606ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පිළිගැනීමට නොහැකි වී තිබුණි.

1.3.9 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

-----------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.6 වගන්තිය | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලබාගිය, සේවය අත්හිටුවා ඇති, මියගොස් ඇති හා විස්තර හඳුනාගත නොහැකි සේවකයින් 75 දෙනෙකුගෙන් අයවිය රු.312,600ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ). ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 17 | 2012 වර්ෂයේ මුද්‍රණය කළ උපපත්‍රිකා පොත් 500ක් ලේඛන ගතකර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,991,713ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,997,173ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.
-----------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| I. | වරිපනම් හා බදු. | 3,581 | 1,991 | 1,590 |
| II. | බදු කුලී. | 4,316 | 2,150 | 2,166 |
| III. | බලපත්‍ර ගාස්තු | 1,609 | 1,609 | 0 |
| IV. | වෙනත් ආදායම්. | 5,956 | 3,870 | 2,086 |

2.2.2 බදු කුලී
--------

(අ). සභාව සතු කඩ කාමර 18ක් බදු දීමෙන් 2013 දෙසැම්බර් 31 දිනට වූ රු.1,062,600ක හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ). වලපනේ හා රාගල නගර තුළ ඇති පොදු වැසිකිළි දෙකක් බදුදීමෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.280,619ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 වෙනත් ආදායම්
-----------------

2011 ඔක්තෝබර් 06 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව මගින් වලපනේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ කුලී රථ නවතා තැබීම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද, 2013 වර්ෂය තුළ කිසිදු මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-------------------------------

මධ්‍යම පළාත් සභාවෙන් අයවිය යුතු රු.2,621,278 ක උසාවි දඩ හා රු.2,944,160 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබී නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කාර්යය සාධනය ඇගයීම
----------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවීම තහවුරු කරගැනීම සඳහා භෞතික හා මූල්‍ය කාර්යය සාධනය දැක්වෙන ප්‍රගති වාර්තා හා පාලන වාර්තා පිළියෙල කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

----------------------------------

(අ). ප්‍රාදේශිය සභා මූල්‍ය හා පරිපාලන රීති අංක 19 අනුව උපපත්‍රිකා පොත් සභාවේ ලේකම්වරයා භාරයේ පැවතිය යුතු අතර, ඒවායේ සුරක්ෂිත භාවය හා භාවිතය පිළිබඳ ඔහු පෞද්ගලිකව වගකිව යුතු වුවත් මෙම කාර්යාලයේ උපපත්‍රිකා පොත් 11ක් අස්ථානගතවී තිබුණි. මෙම උපපත්‍රිකා පොත්වලින් අයකළ හැකි මුදල් පිළිබඳව පරීක්ෂණ දින වන විට තක්සේරුවක් කර නොතිබුණු අතර සිදුවිය හැකි අලාභයන් අයකර ගැනීමටත් පියවර ගෙන නොතිබුණි.

(ආ). සභාව සතු වාහන 09ක් 2009 වර්ෂයෙන් පසු වසර 05කට අධික කාලයක් මුළුල්ලේ රක්ෂණය කිරීමෙන් තොරව ධාවනය කරමින් පැවතුණි.

(ඇ). සභාව සතු අංක CPQR – 5184 දරන ත්‍රී රෝද රථය සඳහා 2012 අප්‍රේල් 28 සිට 2012 දෙසැම්බර් 19 දක්වා කාලය තුළ ධාවන සටහන් ඉදිරිපත් නොකර තිබියදී රු.142,285 ක් වටිනා පෙට්‍රල් ලීටර් 879 ක් ධාවන සඳහා එම කාලයට ලබාදී තිබුණි.

3.3 නිශ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්

--------------------------------------

සභාව සතු පහත සඳහන් වත්කම් අදාළ කාර්යයට නොයොදවා දීර්ඝ කාලයක් නිශ්කාර්යව පැවතුණි.

| අයිතමය | ප්‍රමාණය |
|---|---|
| වලපනේ නගරයේ කඩ කාමර | 03 |
| 109-9147 දරන හොණ්ඩා වර්ගයේ මොටර් බයිසිකලය | 01 |
| 180 - 901 බජාජ් වර්ගයේ මෝටර් බයිසිකලය | 01 |
| 37 - 9482 ට්‍රැක්ටරය | 01 |
| 290 - 1782 ට්‍රැක්ටරය | 01 |
| 49 - 2003 කුබෝටා වර්ගයේ ට්‍රැක්ටරය | 01 |
| CPRV - 3041 ට්‍රැක්ටර් ටේලරය | 01 |
| KVVP – 7564 මිනි ට්‍රැක්ටර් ටේලරය | 01 |
| කොන්ක්‍රීට් මිශ්‍රණය විශාල | 01 |

3.4 හඳුනාගන්නා ලද අලාභ

-------------------------

ප්‍රාදේශීය සභාවේ අස්ථානගතවූ අංක 1270 දරන උපකුවිතාන්සි පොතේ (අංක 63451 – 63500 දක්වා කුවිතාන්සි අඩංගු) අංක 63486 දරන උපකුවිතාන්සිය මගින් සභාවේ ආදායම් පරීක්ෂකවරයෙකු විසින් අයකරගෙන තිබූ රු.6,000ක හිඟ ව්‍යාපාර බදු වංචා කර තිබුණි.

වගකිව යුතු නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගනු ලබන බව 2014 ජුනි 20 දින සභාපතිවරයා මා වෙත වාර්තා කර තිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

(අ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නායයෑම් ආධාර හා සේවා අංශය විසින් ව්‍යාපෘතියක් ඉදිකිරීමට යෝග්‍ය නොවන බවට වාර්තාකර තිබුණු භූමි ප්‍රදේශයක සභාව විසින් රජයේ හා ආසියානු පදනම් ආධාර උපයෝගී කර ගනිමින් රු.7,184,832ක් වැයකර ඉදිකර තිබූ පදියපැලැල්ල ජල යෝජනා ක්‍රමය සැලසුම් සකස්කිරීමේ දෝෂ හේතුවෙන් සම්පූර්ණයෙන්ම අසාර්ථකවී තිබුණි.

(ආ) පදියපැලැල්ල ජල යෝජනා ක්‍රමය සඳහා කාර්මික නිලධාරි සහතික කර තිබූ රු.1,179,096ක වැඩ වටිනාකම ඉක්මවා සභා ලේකම්වරියගේ නියෝගයක් අනුමැතියකින් තොරව රු.640,000ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

3.6 සණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර, පරිසරයට හානිකර පරිදි කසළ නිල්දණ්ඩාහින්න දඹේකැලේ සහ රාගල ලින්ස්ඩේල් වත්ත යන ස්ථානයන්ට බැහැර කරමින් පැවතුණි.

3.7 අධිභාර

--------

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව ම විසින් ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද රු.29,975 ක අධිභාර 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

4.1 අයවැය පාලනය.

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 07ක සියයට 0.02 සිට සියයට 41.98 දක්වාද වියදම් විෂයයන් 07ක සියයට 6.64 සිට සියයට 121.88 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

4.2 නොවිසඳී ඇති පිළිතුරු නොළත් විගණන විමසුම්.

-------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය සභාව විගණන විමසුම් 10කට පිළිතුරු ලබාදී නොතිබුණි.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ

(අ). ගිණුම්කරණය.

(ආ). අභ්‍යන්තර පාලනය

(ඇ). ආදායම් පරිපාලනය

(ඈ). ණයගැති ණයහිමි පාලනය.

(ඉ). වත්කම්වල කළමනාකරණය